# විෂ සහිත මුහුදු ජීවීන්



ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

## ලොඩියා - Jelly fish



ලොඩියන්ගේ දෂ්ඨන නිසා සිදුවන විෂවීම් වසර පුරා වාර්ථා වේ. මොවුන් දිගු ග්‍රාහිකා සහිත විනිවිද පෙනෙන සිරුරකින් යුක්තය. මෙම ග්‍රාහිකා තුල ඇති විෂ සහිත සෛල ආධාරයෙන් විෂ වීම් සිදු වේ.

දෂ්ඨ කිරීම නිසා මද හෝ උග්‍ර අසාත්මිකතා රෝග ලක්ෂණ ඇති විය හැක. දෂ්ඨ කළ ස්ථානය රතු වීම, ඉදිමීම, හිසරදය, බේටය ස්‍රාවය වීම, ශ්වසන හා හෘද ස්පන්දන වේග වැඩි වීම, උදරයේ හා සන්ධිවල වේදනාව, ක්ලාන්තය හා අංශභාග තත්ත්වයන් ඇති විය හැක.

## මුහුදු ඉකිරි -Sea Urchin



පාෂාණමය මුහුදු පතුලේ ජීවත් වන මෙම ජීවීන් උණවටුන, හික්කඩුව සහ බේරුවල අවට නොගැඹුරු මුහුදේ බහුලව දැකිය හැක. පිටතින් තද කටුවක් සහිත වන අතර ඒ මත විෂ ග්‍රන්ථි සහිත කණ්ඨක පිටතට විහිදී පිහිටයි.

මොවුන්ගේ දිගු තියුණු කණ්ඨක මඟින් මිනිස් සම සිදුරු වීමෙන් වේදනාකාරී තුවාල ඇති වේ.

අධික තෙහෙට්ටුව, මස්පිඩු වේදනාව, හුස්ම ගැනීමේ අපහසුතාවය, අංශභාගය, කම්පනය සහ මරණය පවා ඇති විය හැක.

තවද මෙම කණ්ඨක කැඩී මිනිස් සමතුල ශේෂවීමක් සිදුවුවහොත් ඒවා ඉවත් කිරීමට ශල්‍යකර්ම පවා කිරීමට සිදු වේ.

## ඉත්තෑ මත්ස්‍යයා -Porcupine fish



නොගැඹුරු මුහුදු ජලයේ දක්නට ලැබේ. සිරුර තියුණු කණ්ඨක වලින් වැසී ඇත. මෙම කණ්ඨක ශරීරය පිම්බීමට පෙර පවා දැකිය හැක. මෙම කණ්ඨක ශරීරයේ ඇනීමකදී වේදනාකාරී තුවාලයන් සහ ඉදිමීම් ඇති කරයි. එමෙන්ම මෙම සතුන්ගේ අභ්‍යන්තර අවයවවල ප්‍රබල ස්නායු විෂ හෙවත් "නියුරොටොක්සීන" අඩංගු වේ. මේවා ශරීර ගතවීමෙන් ස්නායු සම්ප්‍රේෂණයට බාධා ඇති කරයි. එමෙන්ම අංශභාග තත්ත්වයන් සහ මරණයටද හේතු විය හැක.

**ඉත්තෑ මාංශ කිසි විටෙකත් ආහාරයට ගැනීමෙන් වළකින්න.**

## ගිනිමහ

## Scorpion fish



මෙම මසුන් වෙරළබඩ උණුසුම් වෙරළ තීරයේ දැකගත හැක. පිහාටු වැනි වරල් විෂ සහිත කටු වලින් යුක්තය. රතු පැහැ විවිධ වර්ණවලින් දැකගත හැක. වරල්වල ඇති කණ්ඨක ඇනුන විට දැඩි වේදනාවක් හා ඉදිමීමක් ඇති වේ.

## මුහුදු සර්පයින්

මුහුදු සර්පයින් අතර උග්‍ර විෂ සහිත විශේෂද ඇත. සාමාන්‍යයෙන් මොවුන් ආක්‍රමණශීලි නොවේ.

මොවුන් දෂ්ට කළද බොහෝ විට විෂ මුද නොහරින අතර ආරක්ෂාව පිණිස විෂ සහිත දෂ්ටනයන් කලාතුරකින් සිදු කරයි. බොහෝ විට තම විෂ උපයෝගී කරගන්නේ ගොදුර අඩපණ කරගැනීම සදහාය. නමුත් දෂ්ටනයන් කිසිදු විටෙක අවතක්සේරු නොකළ යුතුය.

## බඩ කහ මුහුදු නයා- මහ වාලක්කඩියා

## Yellow-belly sea snake - Walakkadiya



වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදේ දැකිය හැකිය. බස්නාහිර, දකුණ හා ගිනිකොණ වෙරළ තීරයේ හමු වේ.

පෘෂ්ඨීයව වර්ණය කළු හෝ දුඹුරු පැහැ විය හැකි අතර, ඉහළ උදරීය පෙදෙස ලා දුඹුරු හෝ කහ පැහැතිය. විෂ මාරාන්තිකය.

මාංශ පේශිවල තද ගතිය, පාද ඉදිමීම, දිව පිටතට ගැනීමේ අපහසුව වැනි රෝග ලක්ෂණ පහළ වේ.

## වාලක්කඩියා

## Beaked or Hook-nosed Sea Snake



මුහුදු, කලපු හා මෝය ආශ්‍රිතව කිවුල් ජලයේ දක්නට ලැබෙන විශාල උග්‍ර විෂ සහිත මුහුදු සර්පයෙකි. ධිවරයින්ගේ මාළු දැල්වලට හසු වී හමුවන මෙම සර්පයින් ආක්‍රමණශීලි වන අතර දැල්වලින් ඉවත් කිරීමට යාමේදී දෂ්ඨ කරයි.

## මහ මුහුදු නයා

## Viperine Sea Snake



මෙම සර්පයින් 5 -10 km පමණ ඔබ්බෙන් වූ ශ්‍රී ලංකාවේ උතුරු වෙරළ තීරයට සීමා වේ. උග්‍ර විෂ සහිතය. ධිවරයින්ගේ මාළු දැල්වලට හසු වී හමුවන මෙම සර්පයින් ආක්‍රමණශීලි ලෙස දෂ්ඨ කරයි.

පොදු රෝග ලක්ෂණ වන්නේ මාංශ පේශිවල වේදනාව, ඇවිදීමට නොහැකි වීම, සන්ධි වේදනාව, බොඳ වී පෙනීම, ගිලීමේ අපහසුතාව, අධික ලෙස ඛේටය ස්‍රාවය වීම සහ ඇහිපිය ඇරීමේ අපහසුතාව යනාදියයි.

## <u>ප්‍රථමාධාර</u>

1. රෝගියා නිසලව තබන්න. දේහ චලනයන් වේදනාව වැඩි කරවයි.
2. වේදනාව සමනය කිරීමට දෂ්ඨ කළ ස්ථානයේ අයිස් බෑගයක් තබන්න
3. වේදනාව සමනය කිරීමට වේදනා නාශක ඖෂධ (Paracetamol) නියමිත මාත්‍රාවක් දෙන්න
4. ලොඩියකුගේ දෂ්ට කිරීමට ලක්වූ පුද්ගලයා දියෙහි ගිලීයාමෙන් බේරා ගන්න.
5. ග්‍රාහිකා ඉවත් කිරීම සෘජුවම සිදු නොකරන්න. කෝටුවක්, කාඩ්බෝඩ් කැබැල්ලක් හෝ ටිවිසරයක් වැනි ආධාරකයක් ඒ සඳහා භාවිතා කරන්න.
6. මීතයිල් මධ්‍යසාරය හෝ ඊතයිල් මධ්‍යසාරය පීඩාවට ලක්වූ ප්‍රදේශයට වත් නොකරන්න.
7. මුහුදේ නෑමකින් පසු ඔබේ ශරීරයේ යම් කැසීමක්, බිබිලි දැමීමක් හෝ වෙනත් අසාත්මික රෝග ලක්ෂණයක් ඇත් නම් හැකි ඉක්මණින් රෝහල කරා රැගෙන යන්න.

## මුහුදු ජීවි විෂවීම් වැළැක්වීම

- ලොඩියන් බහුල ප්‍රදේශවල දිය නෑමේදී හැකිතාක් ප්‍රවේශම් වන්න
- ලොඩියන් හෝ මුහුදු ඉකිරි බහුලව සිටින ප්‍රදේශවල දියනෑම හෝ කිමිදීමේදී ආරක්ෂිත ඇඳුම්, සපත්තු පළඳින්න
- හදුනා නොගත් මුහුදු මාළු කිසිවිට අනුභව නොකරන්න

# විෂ වීමකදී..........

# අමතන්න...............

ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල

**දුරකථන අංක 011-2686143/011-2691111
දිගුව 2430**

**Email : <u>npdic.nhs@gmail.com</u>
infotoxlanka@gmail.com**

**https://www.facebook.com/ NTPICSL**

**Web site [http://www.toxbaselanka.info](http://www.toxbaselanka.info)**

**ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි**